# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,215 — 1962 ජූලි 20 වැනි සිකුරාදා — 1962.7.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1064 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 1061 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1062 | ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 1063 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 1063 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1066 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


[සැ. යු.—මේ වර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාමලේඛනය පළවේ.]

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 283**

අංකය : ඩී/විඑෆ්/30.

**යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද තනතුරෙන් බැහැර යැවීමක්, මාරුකිරීමක්, පත්කිරීමක් හා උසස් කිරීමක්**

තනතුරෙන් බැහැර යැවීමක්

1962 ජනවාරි මස 29 දින සිට ලංකා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය අණදෙන නිලධාරි තනතුරෙන් කර්නල් පෙඩ්රික් සිසිල් ද සේරම්, ඕ. බී. ඊ., ඊ. ඩී. බැහැර යවා ඇත.

මාරුකිරීමක්

1962 ජනවාරි මස 29 වෙනි දින සිට කර්නල් පෙඩ්රික් සිසිල් ද සේරම්, ඕ. බී. ඊ., ඊ. ඩී., ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු උප සේවයට මාරුකර ඇත.

පත්කිරීමක්

2 වෙනි (ස්වේච්ඡා) ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි වශයෙන් ඔහු දරණ තනතුරේ රාජකාරිවලට අතිරේකව 1962 ජනවාරි මස 29 වෙනි දින සිට බ්‍රෙවට් කර්නල් සූරියරත්න ඩග්ලස් රත්වත්තේ, ඊ. ඩී., ල. සි. රෙ. ලංකා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය අණදෙන නිලධාරි තනතුරට පත් කර ඇත.

උසස් කිරීමක්

1962 ජනවාරි මස 29 වෙනි දින සිට කර්නල් වශයෙන්.—
බ්‍රෙවට් කර්නල් සූරියරත්න ඩග්ලස් රත්වත්තේ, ඊ. ඩී., ල. සි. රෙ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කිව්. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි 12 වෙනිදා,
කොළඹ දීය.

7-794

---

**1962 අංක 284**

අ. ආ. කා. අංකය : සී. 245/60

1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 51 වැනි වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්, ඩී. ජී. ඇල්. මිසෝ මහතා, 1961 දෙසැම්බර් 1 වැනි දින සිට කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරට පත්කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1962 ජූලි 14 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.
7-785

අ. ආ. කා. අංකය : සී. 162/49 (3)

වැඩ බැලූ සොලිසිටර්-ජනරාල් ඒ. ඇල්. ඇස්. සිරිමාන්න මහතා, අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත්කිරීම පිළිබඳවූ 1962 ජූලි 5 වැනි දින අංක 13,199 දරන ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවුණු 1962කේ අංක 263 දරන නිවේදනයෙහි දැක්වෙන "1962 ජූලි 2" යන දිනය වෙනුවට "1962 ජූලි 4" යන දිනය ආදේශ කරන්න.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1962 ජූලි 13 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

7-784

---

# රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 285**

ඒ. 41/47.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 1962 ජූලි මස 16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම්, සිවිල් සේවක එච්. ඇල්. ගුණසේකර මහතා, ස්වකීය රාජකාරිවලට අතිරේකව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ලෙස වැඩ බැලීමට පත්කර ඇත.

එච්. ඇල්. ගුණසේකර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්.

1962 ජූලි මස 16 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඝීලයේදීය.
තැ. පෙ. 500.

7-788/1

---

**1962 අංක 286**

ඒ. 168/62.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලංකා සිවිල් සේවයේ ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම් මහතාගේ 1 වැනි පෙළේ 2 වැනි ශ්‍රේණියේ සිට 1 වැනි පෙළේ 1 වැනි ශ්‍රේණියට කරනලද උසස් කිරීම 1961 ජූනි මස 1 වැනි දිනට පෙරදාතම් කර ඇත.

එච්. ඇල්. ගුණසේකර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්.

1962 ජූලි මස 16 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඝීලයේදීය.
තැ. පෙ. 500.

7-788/2

---

**1962 අංක 287**

ඒ. 168/62.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලංකා සිවිල් සේවයේ පහත සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දිනයන්හි සිට උසස් කර ඇත—

(1) කේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා ලංකා සිවිල් සේවයේ 1 වැනි පෙළ 2 වැනි ශ්‍රේණියේ සිට 1 වැනි පෙළේ 1 වැනි ශ්‍රේණියට ... ... 61.9.1

(2) ඩබ්ලිව්. පතිරණ මහතා ලංකා සිවිල් සේවයේ 2 වැනි පෙළේ සිට 1 වැනි පෙළේ 2 වැනි ශ්‍රේණියට ... 62.5.14.

එච්. ඇල්. ගුණසේකර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්.

1962 ජූලි මස 16 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඝීලයේදීය.
තැ. පෙ. 500.

7-788/3

---

**1962 අංක 288**

ඒ. 168/62.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලංකා සිවිල් සේවයේ පහත නම් සඳහන් නිලධාරීන්ගේ 2 වැනි පෙළේ සිට 1 වැනි පෙළේ 2 වැනි ශ්‍රේණියට කරනලද උසස් කිරීම් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති දිනවලට පිළිවෙලින් පෙරදාතම් කර ඇත:—

(1) ඒ. ආර්. රත්නවේල් මහතා ... ... 61. 6. 1
(2) සී. ජේ. සේරසිංහ මහතා ... ... 61. 6. 1
(3) සී. ද ෆොන්සේකා මහතා ... ... 61.11.13
(4) බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න මහතා ... 61.12.12
(5) ඇල්. බී. අබේරත්න මහතා ... ... 62. 1. 1

එච්. ඇල්. ගුණසේකර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම්.

1962 ජූලි මස 16 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඝීලයේදීය.
තැ. පෙ. 500.

7-788/4

---

**1962 අංක 289**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය:—

ඒ. 192/62.

1962 ජූනි මස 20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු සහ නියෝජ්‍ය ප්‍රධාන කලමනාකරුවූ ඊ. පී. ස්වෝන් මහතා ප්‍රධාන කලමනාකර ධූරයෙහ් වැඩ බැල්මට.

ඒ. 163/62.

1962 මැයි මස 21 වැනි දින සිට සිවිල් සේවක බී. මහාදේව මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු හෝ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් සිවිල් සේවක පී. ඒ. සිල්වා මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව රබර් පාලක, තේ පාලක හා පොල් වැවීම නගා සිටුවීමේ කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 162/62.

1962 මැයි මස 9 වැනි දින සිට ප්‍රධාන තක්සේරුකරු පී. එච්. වික්‍රමසිංහ මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු හෝ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශයේ සහකාර ලේකම් සිවිල් සේවක ඊ. සිවඥානම් මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව ප්‍රධාන තක්සේරුකරු වශයෙන් වැඩ බැලීමට.

ඒ. 174/62.

1962 මැයි මස 26 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක එච්. වික්‍රමසිංහ මහතා වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒ. 120/62.

1962 ජූනි මස 18 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමුපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් ජේ. පී. ඊ. සිරිවර්ධන මහතා සමුපකාර, සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (පාලන) වශයෙන් වැඩ බැලීමට.

ඒ. 74/59.

ආධුනික සහකාර පොලිස් අධිකාරි ටී. පී. ඇෆ්. ද සිල්වා මහතා 1962 අප්‍රියෙල් මස 1 වැනි දින සිට සහකාර පොලිස් අධිකාරි වරයෙකු වශයෙන්.

ඒ. 86/62.

1961 දෙසැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ දිසාපති තැනගේ කායඝීල සහකාර සිවිල් සේවක කේ. කන්දසාමි මහතා ස්වකීය රාජකාරිවලට අතිරේකව පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් වැඩ බැලීමට.

එච්. ඇල්. ගුණසේකර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩ බලන ලේකම්.

1962 ජූලි මස 16 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඝීලයේදීය.
තැ. පෙ. 500.

7-788/5

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 290**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑස්. 11/48.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජුලි 7 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 9352/එල් දරණ නඩුවේ තීන්දුව දීමට, කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 29සී/61.

එම්. ජමීල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජුලි 5 වැනි දින සිට 7 වැනි දින දක්වා, කොළඹ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 37ඒ/55.

පී. මරපන සහ වී. ජේ. රාජරත්නම් යන මහතුන් නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඳලාගම මහතා 1962 ජුලි 8 වැනි දින, කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා කෑගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උඳලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 ජුලි 13 වැනි දින සිට 15 වැනි දින දක්වා, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 48/48 (ඒ).

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. එම්. කාසිම් මහතා 1962 ජුලි 10 වැනි හා 12 වැනි දිනයන්හි, හලාවත, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, පුත්තලමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා පුත්තලමේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 48/48.

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1962 ජුලි 9 වැනි දින සිට, හලාවත, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, පුත්තලමේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා පුත්තලමේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වෙස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 41ඒ/60.

එස්. ජේ. එම්. පී. එස්. මුදන්නායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 ජුලි 21 වැනි දින, කළුතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 42ඒ/53.

ඩී. පී. තිස්සංග මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා 1962 ජුලි 18 වැනි දින සිට 20 වැනි දින දක්වා, මාතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතර, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 16ඒ/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ජී. එල්. ද සිල්වා මහතා 1962 ජුලි 19 වැනි දින, බලපිටියේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. අයි. ගුණරත්න මහතා 1962 ජුලි 14 වැනි දින සිට 18 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බිදුරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1962 ජුලි 9 වැනි දින සිට 11 වැනි දින දක්වා, මඩකලපුවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මඩකලපුවේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා 1962 ජුලි 9 වැනි දින, අවිස්සාවේල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අවිස්සාවේල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 51ඒ/54.

වී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඳලාගම මහතා 1962 ජුලි 15 වැනි දින සිට 17 වැනි දින දක්වා, කෑගල්ලේ, අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පිඑල්/කේ. 1/48.

එම්. බී. කප්පාගොඩ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එස්. මහලේකම් මහතා 1962 ජුලි 12 වැනි හා 13 වැනි දිනයන්හි, මහනුවර, දිස්ත්‍රික්කයේ පාත දුම්බර හා උඩ දුම්බර ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජුලි 12 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

7-653

# වෙනත් පත් කිරීම් ආදිය

**1962 අංක 291**

ඊබී/ඒ—පීඑජ් 305.

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත්වීම කර ඇත :—

සිවිල් සේවක ඩබ්ලිව්. එච්. පෙරෙයිරා මහතා 1962 මැයි මස 1 වැනි දින සිට සේවා දෙපාර්තමේන්තුවේ කායශීල සහකාර වශයෙන් වැඩ බැලීමට.

ආර්. ජේ. පෙරේරා,
ස්ථිර ලේකම් වෙනුවට.

1962 ජුලි මස 13 වැනි දින,
කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික අමාත්‍යාංශය,
කොළඹ 7.

7-724

**1962 අංක 292**

ආර්නෝල්ඩ් ලෙවලින් ද සිල්වා මහතා නුවරඑළිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජුලි මස 7 වැනි දින,
කොළඹ දී ය.

7-604

**1962 අංක 293**

චාර්ල්ස් ඇල්බට් සිල්වා ජයසූරිය ගුණවර්ධන මහතා ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, සවදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජුලි මස 7 වැනි දින,
කොළඹ දී ය.

7-603

**1962 අංක 294**

නිහාල් ඇලිස්ටෙයර් විජේරත්න ජයතිලක සේරසිංහ මහතා ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජූලි මස 7 වැනි දින,
කොළඹ දී ය.

7-601

---

# ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී. 129/48.

පිළුන් 1351 (II කාණ්ඩය)

## රජයේ හා අධිකරණ නිලධාරීන් පිළිබඳ (විශ්‍රාම ගැනීමේ) ආඥාපනත

(355 වෙනි අධිකාරය වන) රජයේ හා අධිකරණ නිලධාරීන් පිළිබඳ (විශ්‍රාම ගැනීමේ) ආඥාපනතෙහි 2 වෙනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අග්‍රාණ්ඩුකාරවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාව.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1962 ජූනි 25,
කොළඹ, රාජිණී ගෘහයේ දීය.

**ව්‍යවස්ථාව**

රජයේ හා අධිකරණ නිලධාරීන් පිළිබඳ (විශ්‍රාම ගැනීමේ) ආඥාපනතෙහි 2 වෙනි වගන්තිය යටතේ පනවනු ලැබ, අංක 9,970 හා 1949 අප්‍රේල් 29 වෙනි දින දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ව්‍යවස්ථා, කලින් කල සංශෝධිත ව, පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) 1 වෙනි ව්‍යවස්ථාවෙහි, (1) වෙනි ඡේදයේ අතුරු විධානය වෙනුවට පහත සඳහන් අතුරු විධානය, එනම්:—

"එසේ වුව ද, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වින්නඹු මාතාවන් හා අත් එන්නත් කරන කාන්තාවන් ද, නීතිඥයන් නොවන ගම්බද අධිකරණ සභාපතිවරුන් ද සම්බන්ධයෙන් අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු පනස් පහ විය යුතු ය"

ආදේශ කිරීමෙන්; හා

(2) 2 වෙනි ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ අතුරු විධානයෙහි, 1 වෙනි තීරයේ (1) වෙනි කරුණෙහි "සාත්තු සේවිකාවන් හෝ වින්නඹු මාතාවන්" යන වචන වෙනුවට "සාත්තු සේවිකාවන්, වින්නඹු මාතාවන් හෝ අත් එන්නත් කරන කාන්තාවන්" යන වචන ආදේශ කිරීමෙන් ද වේ.

7-798/1

---

අංකය: පීආර්/ඒඑජ්/108.

එම්. පලීල් ඒ කපූර් මහතා දිවයිනට ආපසු පැමිණ, වැඩබැලූ මොහිදීන් ඒ. කපූර් මහතා සේවයෙන් මුදාහරිමින්, ඉරාකය වෙනුවෙන් කොළඹ සිටින නිර්වේතනික කොන්සල් වශයෙන්, 1962 ජූලි මස 2 වැනි දින නැවතත් වැඩ භාරගත් බැව් සාමාන්‍ය දැනගැනීම සඳහා දැනුම් දෙනු ලැබේ.

ඇන්. කයු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1962 ජූලි මස 9 වෙනි දින,
කොළඹ දී ය.

7-568

---

## ලිපිනය වෙනස්වීම

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලෙහි පිහිටුවා තිබුණු, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ පුරවැසි ශාඛාව, 1962 ජූලි 4 වැනි දින දී කොළඹ 1, උත්තර මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ලට ගෙන යන ලදී. ටැලිෆෝන් අංකවල වෙනසක් නැත.

ස්ථාවර ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය.

1962 ජූලි මස 12 වැනි දින,
කොළඹ.

7-619

---

ඇල්. ඩී.—බී 97/41.

අංකය: පී.ඇන්. 1351 (II කාණ්ඩය)

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි 51 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය යි.

පිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1962 ජූනි 25,
කොළඹ.

**නිවේදනය**

කලින් කල සංශෝධනය කරනු ලැබූ, 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. එනම්:—

(1) 14 වෙනි වගන්තියේ පළමු වෙනි අතුරු විධානයෙහි "යුරෝපීය මේට්‍රන්වරියන්, යුරෝපීය සාත්තුකාර සහෝදරියන් හා මෙරටින් පත් කරණු ලැබූ මේට්‍රන්වරියන් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "මේ රටින් පත්කරනු ලැබූ මේට්‍රන්වරයින් සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) 17 වෙනි වගන්තියෙහි —

(අ) "යුරෝපීය මේට්‍රන්වරියන්, යුරෝපීය සාත්තුකාර සහෝදරියන්, වින්නඹු මාතාවන් සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "වින්නඹු මාතාවන් සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්; හා

(ආ) "අවුරුදු පනහ" යන වචන වෙනුවට "අවුරුදු පනස් පහ" යන වචන ආදේශ කිරීමෙන් ද;

(3) අංක 26අ දරන වගන්තිය අවලංගු කිරීමෙන් ද වේ.

7-798/2

---

අංක: 543ඊ236/6 සීඩී.

මෙහි පහත නියමිත තනතුරු දරන්නන් විශ්‍රාම වැටුප්වලට හිමිකම් ඇත්තන් බව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ:—

**ගුවන් විදුලි දෙපාර්තමේන්තුව**

ගුවන් විදුලි අධ්‍යක්ෂ (ස්වදේශීය සේවය)

ගුවන් විදුලි අධ්‍යක්ෂ (වෙළඳ සේවය)

හ. ෂ. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1962 ජූලි මස 7 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දී ය.

7-616

---

ඇල්. ඩී.—බී 51/53.

## රබර් නැවත වගාකිරීම පිණිස ආධාර දීමේ පනත

(437 අධිකාරය වන) රබර් නැවත වගාකිරීම පිණිස ආධාර දීමේ පනතේ 8 වැනි වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

1962 ජූලි 7 දින,
කොළඹ.

**නියෝගය**

කලින් කල සංශෝධිතව අංක 11,300 හා 1958 අප්‍රියෙල් 18 දින දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 රබර් නැවත වගාකිරීම පිණිස ආධාර මුදල් දීමේ සේවකයින් ගේ (අර්ථ සාධක අරමුදල්) නියෝගයන්හි, 4 (1) නියෝගය පහත සඳහන් අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) (සී) ඡේදයෙහි "නීතිගත සංස්ථාව" යන වචනය වෙනුවට "නීතිගත සංස්ථාව හෝ" යන වචන ආදේශ කිරීමෙන්,

(2) (සී) ඡේදයට ඉක්බිතිවම, පහත සඳහන් අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන්,

"(ඩී) සිංහල භාෂාවෙන් කටයුතු කිරීමට නොහැකි වීම නිසා, 1963 දෙසැම්බර් මස 31 වෙනිදා හෝ ඊට පෙර, මෙම දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර, එසේ විශ්‍රාම ලබන කෙනකුට."

7-613

## පඩි පාලක සභා ආඥාපනත

වෂී 1962 මැයි මස 10 වැනි දින සිට අවුරුදු 3 ක කාලයක් තුළ කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් හැටියට පෙනී සිටීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 අධිකාරයේ) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමති තුමන් විසින් මෙහි පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
ස්ථිර ලේකම් වරයා,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශය.

1962 ජූලි මස 11 වැනි දින,
කොළඹදීය.

**නම නියමකොට පත් කරන ලද සාමාජිකයෝ :**

1. සිල්වියා ප්‍රනාන්දු මහත්මිය.
2. සී. ඊ. සිම්ත්‍රාරච්චි මහතා.
3. ඇස්. ඒ. විජේතිලක මහතා.

**සේව්‍ය නියෝජිත සාමාජිකයෝ :**

1. ඇන්. ඇස්. ද ඇස්. වික්‍රමසිංහ මහතා.
2. ඩී. ඩබ්ලිව්. වික්‍රමරත්න මහතා.
3. ලොයිඩ් වික්‍රමසූරිය මහතා.
4. ඔස්ටින් ඒ. ද සිල්වා මහතා.
5. කේ. ජී. සී. අබේසූරිය මහතා.
6. ජේ. ඊ. පී. රාජපක්ෂ මහතා.

**සේවක නියෝජිත සාමාජිකයෝ :**

1. එච්. ඇලන්ඩ් සිල්වා මහතා.
2. ටී. අවුටින් මැන්දිස් මහතා.
3. කේ. ඩබ්ලිව්. රූසන් සිල්වා මහතා
4. එච්. සී. වෙඩිවර්ධන මහතා.
5. ඇම්. ජී. මැන්දිස් මහතා.
6. ඩී. පියදාස මහතා.

7-700

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූලි මස 7 වැනි දීය,
කොළඹ 2.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මුදලි තුමාගේ ආදායම් පාලක කොට්ඨාශයේ, කිත්තන්පහුව ගම්මුලාදෑනි වසම තුළ පිහිටි කටු පැලැල්ල වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 25ක පමණ ඉඩම් කොටසක් :—

උතුරට : කොළඹ අවිස්සාවේල්ල ප්‍රසිද්ධ පාර ; නැගෙනහිරට : ගම් සභා පාර ; දකුණට : පාසැල් සඳහා වෙන්කර ඇති ඉඩම් කොටස් සහ පුද්ගලික ඉඩම් ; බස්නාහිරට : පුද්ගලික ඉඩම්.

7-580

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 ජූලි මස 7 වැනි දිනදීය,
කොළඹ 2.

### උපලේඛනය (I)

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 209 දරණ යටලමත්ත ගම්මුලාදෑනි වසමේ පිහිටි නාගොඩවත්ත නොහොත් නායාමුල්ල කන්ද නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 2½ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : නාගොඩ වතුයායට අයත් කුඹුරු සහ දියපාර ; නැගෙනහිරට : නාගොඩ වතුයායට අයත් කුඹුර ; දකුණට : සී. පී. දිසානායක මහතාට අයිති තේ වත්ත ; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

### උපලේඛනය (II)

ඉහත සඳහන් ඉඩමට යැම්ඊම් සඳහා සී. පී. දිසානායක මහතාට අයිති තේ වත්ත උඩින් නාගොඩ යටලමත්ත ප්‍රසිද්ධ පාරේ සිට අඩි 30ක් පලලැති පාරක් සඳහා පරවශතාවයක් ද අත්පත් කරගත යුතුය. ඊට මායිම් :—

උතුරට : නාගොඩ වතුයායට අයිති කුඹුර ; නැගෙනහිරට : නාගොඩ යටලමත්ත ප්‍රසිද්ධ පාර ; දකුණට : සී. පී. දිසානායක මහතාට අයිති තේවත්ත ; බස්නාහිරට : නාගොඩවත්ත නොහොත් නායාමුල්ල කන්ද.

7-560

---

4 බී ෆෝර්මය

## 1949 නො 3 දරණ ඉන්දියානු සහ පකිස්ථානි නිවැසි (පුරවැසි) පනත

### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පකිස්තානි වාසීන් ලියා පදිංචි කිරීමේ කොමසාරිස් තැන්පත් විජයපාල වියුටර් ජයසිංහ වන මා, 1949 නො 3 දරණ ඉන්දියානු සහ පකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උපවගන්තිය යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබිද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධ කළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධ වන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුලත්විය යුතුයි.

වී. ඊ. ජයසිංහ,
ඉන්දියානු සහ පකිස්ථානි වාසීන් ලියා පදිංචිකිරීමේ
කොමසාරිස් තැන.

කොළඹ,

1962 ක්වූ ජූලි මස 9 දා.

### උපලේඛනය

| ඉල්ලුම් පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචි කිරීමට අයැද සිටින ඉල්ලුම් කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියා පදිංචි කිරීමට ඉල්ලුම් කරන අයගේ නමත් සමග ලියා පදිංචි කිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධය |
|---|---|---|
| ඇල්. 8624 1951.7.13 | කන්දන් අඩයික්කන් සිලන් බන්, පී. 29, පාරදෙක, පුස්සැල්ලාව | සිලන්බායි (භාර්යාව), ජය ලක්ෂමි (දුව), මහේස්වරි (දුව), ලලිතා (දුව), සරෝජා (දුව) |
| ඩබලිව 6976/ටී 1951.7.31 | සුප්පයියා බාලගුරුසාමි, 23/1, විද්‍යාලය පාර, නීරවියඩි, යාපනය | කාලියම්මාල් (භාර්යාව), රාජු (පුතා), මුත්තු ලක්ෂමි (දුව), බාලසුබ්‍රමනියම් (පුතා), මාරිසාමි කනේස–ලිංගම් (පුතා) |

7—566

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥාපනත

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන්පත් ආතර් රාජකුමාර් රත්නවේල් මහතා විසින් 1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපණතේ අංක 113 දරණ වගන්තියේ ප්‍රකාර මා වෙත පවරා ඇති බලතල අනුව, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් ඇම්. බී. සී. සිල්වා වන මම, එකී ආඥාපනතේ අංක 15 (1) (ඒ) දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් යෝජනාව අනුමත කරමි.

ඇම්. බී. සී. සිල්වා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
රත්නපුර, දිස්ත්‍රික්කය.

### උපලේඛනය

"වර්ෂ 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනතේ V වන කොටස අනුව පිළියෙල කරණ ලද රෙගුලාසි අනුව පිහිටුවන ලද, රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත මැද කෝරලේ සිලෝගම ඌරබොකු වෙල් යාය අමුණ නමැති සුළු වාරි කර්මාන්තය යටතේ වැඩවන කුඹුරු හිමියන් ගේ මෙම රැස්වීම එම වාරි කර්මාන්තය අනුමත කරයි. තවද එකී වාරි මාර්ග ආඥා පණතෙහි 33 (3) (1) දරණ වගන්තිය අනුව මෙම කුඹුරු රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තුමාගේ සතුටට හේතු වන අන්දමට වැඩ කිරීමට මෙම රැස්වීම තීරණය කරයි."

7-553

---

## අංක 23/62 දරන ආනයන පාලන දැන්වීම

### ඉන්දියාවෙන් හරක් මස් හා එළු මස් ආනයන

ප්‍රිවිතපොලියේ නතර කිරීමට යන කොළඹ නාගරික සභාවේ පශු වෛද්‍යවරයා විසින් නිකුත් කරන කොරන්තීනු හා මස් පරීක්ෂණ සහතික මත ඉන්දියාවේ සිට අළුත් හෝ ශීත කරන ලද හරක් මස් හා එළු මස් ආනයනයට ආනයනකයන් වෙත මෙයින් බලය දෙනු ලැබේ. එහෙත්, අපේක්ෂිත ආනයනකයන් විසින් පළමුකොට, කොළඹ නාගරික සභාවේ ප්‍රධාන පශු වෛද්‍යවරයා වෙත ඉල්ලුම් කළ යුතු බැව් දන්වමි.

මේ පාලනායතනයෙන් මේ සඳහා තවදුරටත් බලපත්‍රයක් අවශ්‍ය නැත.

1960. 11. 4 වෙනි දින අංක 12,223 දරන් ගැසට් පතෙහි පළ වූ අංක 38/60 දරන ආනයන පාලන දැන්වීම මෙසේ සංශෝධනය කෙරෙයි. ආසියාවේ හෝ අප්‍රිකාවේ හෝ වෙන කවර තොටුපලකින් වුවද ආනයනයට පෞද්ගලික ආනයන බලපත්‍ර අවශ්‍ය වන්නේ ය.

සී. මයිල්වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ජූලි මස 10 වෙනි දින,
කොළඹ දී ය.

7-620

---

### ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත් පත්තුවේ මැද්දේකැටිය කෝරළයේ අරක්යාල පළාතේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්ති යේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : කරන්ගමුව පළාත සහ පහලපොතුවැව පළාත ; දකුණට : නෙට්ටිපොල ගෙදර පළාත ; නැගෙනහිරට : නෙට්ටිපොල ගෙදර පළාත ; බස්ණාහිරට : නෙට්ටිපොල ගෙදර පළාත සහ මැද්දේ කැටිය කෝරළේ.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කුලියාපිටිය පශු වෛද්‍ය තැනගෙන් හෝ කටුගම්පොල හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඹාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ජූලි 5 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඹාලයේ දීය.

7-551/1

---

### ප්‍රකාශනයයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත් පත්තුවේ මැද්දේකැටිය කෝරළයේ නෙට්ටිපොල ගෙදර පළාතේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥා පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්ති යේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : පහල පොතුවැව පළාත සහ කරන්ගමුව පළාත ; දකුණට : කුරිකොටුව පළාත සහ ගොඩගම පළාත ; නැගෙනහිරට : ඉහළ පොතුවැව පළාත ; බස්නාහිරට : අරක්යාල පළාත සහ කරන් ගමුව පළාත.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කුලියාපිටිය පශු වෛද්‍ය තැනගෙන් හෝ කටුගම්පොල හත්පත්තුව කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඹාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ජූලි 5 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඹාලයේ දීය.

7-551/2

---

### නිවේදනයයි

වර්ෂ 1958 අංක 1 දරණ කුඹුරු පනතේ 51 වන වගන්තියේ 3 වන උප වගන්තිය යටතේ පහත උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරුන් දෙවන තීරයේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්කවලට තුන්වන තීරයේ සඳහන් දින සිට මාරු කරනු ලැබූ බව නිවේදනය කරමි.

ජේ. වී. ෆේපාන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

1962 ජූලි 11 දින,
කොළඹදීය.

| පළමුවන තීරය | දෙවන තීරය | තුන්වන තීරය |
|---|---|---|
| අර්නස්ට් සේපාල ගුණතිලක ... | කුරුණෑගල ... | 1962.6.11 |
| සුප්පයියා සම්මුගසුන්දරම් ... | මන්නාරම ... | 1962.6.11 |
| ගෞතමපාල ජෝර්ජ් වික්‍රමසිංහ ... | මොනරාගල ... | 1962.7.1 |

7-654

## රථ වාහනවලට අවසර

**දකුණු කොට්ඨාශය** **ගාලු දිස්ත්‍රික්කය**

**අකුරැස්ස-දෙදියගල පාරේ අංක 3/3 දරණ පාලම**

තව දුරටත් නිවේදනය කරන තෙක්, ඉහත සඳහන් පාලම අළුත්වැඩියා කිරීමේ අපේක්ෂාවෙන් රථ වාහන සඳහා වසා තිබේ. මේ හැරුණුවිට ඇති අනිකුත් මාර්ගය යක්කලමුල්ල-කැටන්විල හරහා ඇති මාර්ගයයි.

රජයේ වැඩ කාර්යාලය,
කොළඹ,
1962 ජූලි මස 10 වෙනි දින.

එච්. කේ. ඇම්. ප්‍රනාන්දු,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

7-565

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3. 30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය.** ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි